# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,145 - 2019 ඔක්තෝබර් මස 11 වැනි සිකුරාදා - 2019.10.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු ... ... ... | 1784 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බදුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1787 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1801 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 නොවැම්බර් මස 01 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ඔක්තෝබර් මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

### පුරප්පාඩු වී ඇති ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම

කුලියාපිටිය ප්‍රදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණියේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට කුලියාපිටිය ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* | *අවශ්‍ය ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා* | *පළපුරුද්ද* |
|---|---|---|---|---|---|---|
| 1 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු (ප්‍රාථමික ශිල්පීය නොවන) | 01 | රු. 24,250 250 x 10-270x10-300x10-330 x 12-රු. 36,410 PL - 1-2016 (2020.01.01 දින දක්වා ගෙවීම් සිදුකරන්නේ රා.ප.ච.3/2016 හි උපලේඛන අංක ii සඳහන් පරිදිය) | රජය විසින් අනුමත කරන ලද පාසලක 8 වැනි ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය. | - | - |
| 2 | පුස්තකාල සහායක (ප්‍රාථමික ශිල්පීය නොවන) | 01 | රු. 24,250 250 x 10-270 x 10-300 x 10-330 x 12-රු. 36,410 PL-1-2016 (2020.01.01 දින දක්වා ගෙවීම් සිදුකරන්නේ රා.ප.ච. 3/2016 හි උපලේඛන අංක ii සඳහන් පරිදිය) | අ.පො.ස (සා.පෙළ) විභාගයේ විෂයයන් දෙකක් සමත්වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) | - | - |

01. *අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.

(ii) අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ඡන්ද හිමි නාම ලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරන සහතිකයකින් සනාථ කළ යුතුය.)

(iii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. (දැනට ස්ථිර සේවයේ නියුතු අයට වයස් සීමාව බලනොපැවැත්වේ.)

(iv) දණ්ඩ නීති සංග්‍රහයේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

(v) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

02. *බඳවා ගැනීමේ ක්‍රමය :*

සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගිවන අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් සහ වාචික පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය.

(ii) වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(iii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වේ.

(iv) මෙම බඳවාගැනීමේ කොන්දේසිවලට අමතරව ගරු වයඹ ආණ්ඩුකාරතුමා විසින් 2008.11.19 දින අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ කොන්දේසිවලට ද මුදල් රෙගුලාසිවලටද රජයේ දෙපාර්තමේන්තු නියෝගවලටද වයඹ පළාත් සභාව හෝ වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කුලියාපිටිය ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට ඉල්ලුම්කරු බැඳී සිටිය යුතුයි.

04. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

(I) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරගන්නා ලද අයදුම්පත් 2019.10.31 දින හෝ එදිනට පෙර ලේකම්, කුලියාපිටිය ප්‍රාදේශීය සභාව, බෝහිංගමුව, කුලියාපිටිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(II) අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ............................ තනතුර සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කර අයදුම්පත් එවිය යුතුය.

(III) අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

* උප්පැන්න සහතිකය,
* අධ්‍යාපන සහතිකය,
* අස්වීමේ සහතිකය,
* පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය, (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුය.)
* මෑතකදී ලබා ගත් චරිත සහතික 02ක්,
* වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරදී මෙම බඳවා ගැනීම හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලය මා සතුය.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම්,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2019ක් වූ සැප්තැම්බර් මස 16 වැනි දින,
කුලියාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව**

***කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණියේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීම - 2019***

*......................................... තනතුර සඳහා අයදුම් පත්‍රය*

1. අයදුම්කරුගේ නම මුලකුරු සමග :————————————————
2. මුලකුරුවලින් හැඳින්වෙන නම :————————————————
3. ස්ථිර ලිපිනය :————————————————
4. දුරකතන අංකය :————————————————
5. ග්‍රාම නිලධාරී කොට්ඨාසය :————————————————
6. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————————————————
7. දිස්ත්‍රික්කය :————————————————
8. උපන් දිනය: වර්ෂය:——————, මාසය :——————, දිනය:——————
9. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු:——————, මාස:——————, දින:——————

10. ස්ත්‍රී/පුරුෂ භාවය :————————————
11. ශ්‍රී ලංකා පුරවැසියෙක් වන්නේ පරම්පරාවෙන්ද යන වග :————————————
12. විවාහක/අවිවාහක යන වග:————————————
13. ජාතික හැඳුනුම්පත් අංකය:————————————
14. අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (සා/පෙළ) විභාගය :——————————
සමත් වර්ෂය හා විභාග අංකය :——————————

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

15. වෘත්තීය වෙනත් සුදුසුකම් :——————————

16. සේවා පළපුරුද්ද :——————————

(i) දැනට සේවය කරන ආයතනය :——————————
(ii) දැනට දරන තනතුර :——————————
(iii) එම තනතුරට පත් වූ දිනය :——————————
(iv) මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර :——————————

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව දනිමි.

——————————
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————

*දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන .....................................මයා/මිය/මෙනවිය දැනට මෙම ආයතනයේ ........................................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

——————————
ආයතන ප්‍රධානියාගේ හෝ බලය පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

නම :——————————
පදවි නාමය :——————————
ආයතනය :——————————
දිනය:——————————

10-665

# පළාත් පාලන නිවේදන

## අරණායක ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන සභා පනතේ 24 (1) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරණ (අනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති CLG/LG5/5/1/19-1 අංක දරන 2019.05.28 දිනැති ලිපිය අනුව පහත උපලේඛනයේ සඳහන් අරණායක ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම මාවත් සලකුණු කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක් හරහාද එම ඉඩමේ අයිතිකරු ලෙස හිමිකම්පාන යම් පාර්ශවයක් වේනම් මෙම දැන්වීම පළකළ දින සිට මාස තුනක කාලයක් තුළ එම ඉඩමට ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා නිසි අධිකරණයෙහි නඩුවක් පවරා විරෝධතා ඉදිරිපත් කළ යුතු බව ප්‍රාදේශීය සභා පනතේ 24 (2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම්දෙනු ලැබේ.

කේ.ඒ. නිහාල් සෙනවිරත්න,<br>
සභාපති,<br>
ප්‍රාදේශීය සභාව,<br>
අරණායක.

2019 සැප්තැම්බර් මස 20 වැනි දින<br>
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | -: | තලගොල්ල මාර්ගයේ සිට පල්ලේවත්ත දක්වා මාර්ගය |
| මාර්ගයේ ආරම්භය | -: | හත්ගම්පල තලගොල්ල ප්‍රාදේශීය සභා මාර්ගය |
| මාර්ගයේ අවසානය | -: | ඩබ්ලිව්.ඒ. කුලරත්න මහතා හිමිකම් කියන තැන්නෙගෙදර ඉඩම |
| ග්‍රාම නිළධාරි වසම | -: | 47 හත්ගම්පල |
| මාර්ගයේ දිග හා පළල | -: | දිග - මීටර් 56 පළල - අඩි 10 |

මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම්

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| 1. එස්.ඒ. කපිල බණ්ඩාර මයා | ජයසුන්දර වත්ත |

මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම්

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| 1. ඇළ මාර්ගය | |
| 2. ඩබ්ලිව්.ඒ. සෙනෙවිරත්න බණ්ඩා මයා | තැන්නෙගෙදර |
| 3. ඩබ්ලිව්.ඒ. කුලරත්න මයා | තැන්නෙගෙදර |

බලයලත් මිනින්දෝරු එච්.එම්.ආර්.ටී.කේ. හේරත් මයාගේ 2019.02.02 දින මනින ලද පිඹුරුපත් අංක 380/2019 දරණ පිඹුරුපත අනුව වේ.

එච්.එම්.ආර්.ටී.කේ.හේරත්,
බලයලත් මිනින්දෝරු තලමිතිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු,
පින්නවල, රඹුක්කන.

පිඹුරු අංකය: 380/2019

# තලගොල්ල මාර්ගයේ සිට පල්ලේවත්ත දක්වා මාර්ගය

පරිමාණය 1:1000

විස්තරය

ආතා - ආධාරක තාප්පය
සිබැ - සිමෙන්ති බැම්ම
පැවැ - පැලඹුනි වැට
මාර්ග(ප්‍රාස) - මාර්ගය(ප්‍රාදේශීය සභා)




සබරගමුව පළාතේ

කෑගල්ල දිස්ත්‍රික්කයේ

ගල්බොඩ කෝරළේ තුන්පළාත පත්තුවේ

හත්ගම්පොල ගමේ පිහිටි ජයසුන්දර වත්ත සහ තැන්නෙගෙදර යන ඉඩම් හරහා පවතින

මාර්ගය මැන සාදන ලද

-පිඹුර-

| කැබලි අංකය | මාර්ගයේ වර්ග ප්‍රමාණය | | | | දිග(මීටර) | පළල(අඩි) |
|---|---|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අ | රූ | පර් | | |
| 1 | 0.0169 | 00 | 0 | 06.68 | 56.00 | 10 |

සත්‍ය පිටපතක් බව සහතික කරමි

ලේකම්
ප්‍රාදේශීය සභා

2019.04.25
එච්.එම්.ආර්.ටී.කේ. හේරත්
බලයලත් මිනින්දෝරු තලමිතිකරු
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු
ටෙලි : 035-2266422/077 4973610
ලි.ප. අංකය: 19831492

මනින ලද්දේ : 2019.02.02 වන දින

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | -: | පල්කුඹුරහේන පැහිණිබැද්දර මාර්ගය |
| මාර්ගයේ ආරම්භය | -: | පැහිණිබැද්දර ගැවිලිපිටිය මාර්ගය |
| මාර්ගයේ අවසානය | -: | කේ. පී. ඩී. ගුණසිංහ මයා හිමිකම් කියන පල්කුඹුරහේන ඉඩම |
| ග්‍රාම නිළධාරී වසම | -: | 45 සී පැහිණිබැද්දර |
| මාර්ගයේ දිග හා පළල | -: | දිග - මීටර් 137 පළල - අඩි 08 |

මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම්

| | *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 1. | බී. පී. සරත් ගාමිණී මයා | පල්කුඹුර |
| 2. | ඒ. පී. පියරත්න මයා | පල්කුඹුරහේන |
| 3. | බී. පී. රණතුංග මයා | පල්කුඹුරහේන |
| 4. | කේ. පී. ඩී. ගුණසිංහ මයා | පල්කුඹුරහේන |

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම්

| | *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 1. | බී. පී. සරත් ගාමිණී මයා | පල්කුඹුරහේන |
| 2. | එච්. පී. නිමල් වීරසිංහ මයා | පල්කුඹුරහේන |
| 3. | කේ. ජී. මැගී මිය | පල්කුඹුරහේන |
| 4. | කේ. පී. ඩී. ගුණසිංහ මයා | පල්කුඹුරහේන |

බලයලත් මිනින්දෝරු එච්.එම්.ආර්.ටී.කේ. හේරත් මයාගේ 2016.07.30 දින මනින ලද පිඹුරුපත් අංක 206/2016 දරණ පිඹුරුපත අනුව වේ.

එච්.එම්.ආර්.ටී.කේ.හේරත්,
බලයලත් මිනින්දෝරු තලම්තිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු,
පින්නවල, රඹුක්කන.
ලියාපදිංචි අංකය: 19831492

පිඹුරු අංකය: 206/2016

# පල්කුඹුරහේන පැහිනිබැද්දර මාර්ගය

<u>සොමුව</u> :- අරණායක ප්‍රාදේශීය සභා සභාපතිගේ අංක
අර/ප්‍රාස/07/මාර්ග මැනුම් හා 2006.10.04 දින ලිපිය

පරිමාණය 1:1000




<u>විස්තරය</u>
නි - නියර
පැවැ - පැලෙනි වැට
අවි - අවිනිශ්චිත
මාර්ග(ප්‍රා.ස.) - මාර්ග(ප්‍රාදේශීය සභා)

<u>සබරගමුව පළාතේ</u>

<u>කෑගල්ල දිස්ත්‍රික්කයේ</u>

ගල්බඩ කෝරළේ තුන්පළාත පත්තුවේ පැහිනිබැද්දර ගමේ පිහිටි

පල්කුඹුර සහ පල්කුඹුරහේන යන ඉඩම හරහා පවතින මාර්ගය මැන සාදන ලද

සත්‍ය පිටපතක් බව සහතික කරමි
Pad
ලේකම්
අරණායක ප්‍රාදේශීය සභාව

-පිඹුර-

| කැබලි අංකය | මාර්ගයේ වර්ග ප්‍රමාණය | | | | දිග(මීටර්) | පළල(අඩි) | කිවයුතු කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අ | රූ | පර් | | | |
| 1 | 0.0376 | 00 | 0 | 14.86 | 137.00 | 08 | අඩි 08 ට අමතරව අඩි 01 ක් පළල කානුවක්ද ඇත |

2016 . 08 . 07
එච්.එම්.ආර්.ටී.කේ. හේරත්
බලයලත් මිනින්දෝරු තලම්තිකරු
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු
ටෙලි : 035-2266422/077 4973610
ලි.ප. අංකය: 19831492

මායිම් පෙන්වා දුන් අය } ඉඩම් හිමිකරුවන්
මායිම් බලා ගත් අය }

මනින ලද්දේ : 2016.07.30 වන දින

මාර්ගයේ නම -: කරහම්පිටිගොඩ මිරිය වෙල්යාය මාර්ගය

මාර්ගයේ ආරම්භය -: තල්ගමුව දෙවනගල ප්‍රාදේශීය සභා මාර්ගය

මාර්ගයේ අවසානය -: එම්.ජී. මාලනී මැණිකේ හිමිකම් කියන මිරියවෙල ඉඩම

ග්‍රාම නිළධාරී වසම -: 33 බී දෙවනගල

මාර්ගයේ දිග හා පළල -: දිග - මීටර් 290 පළල - අඩි 12

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම්*

01. ඇළ මාර්ගය

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම්*

| | *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 01. | අනෝමා දිසානායක | දසයලාහ |
| 02. | ජී.එම්.ඩී. මේසසූරිය | අටලාහ |
| 03. | ආර්.ඩබ්ලිව් අනෝමා ජයසිංහ | මිරියවෙල |
| 04. | එම්.ජී. වසන්ත පුෂ්පකුමාර | මිරියවෙල |
| 05. | විලියොන් | මිරියවෙල |
| 06. | ජී.එච්.ජී නවරත්න | මිරියවෙල |
| 07. | ජී.එච්.ජී. නිරංජලා කුමාරි | මිරියවෙල |
| 08. | ජී.එච්.ජී. චන්ද්‍රරත්න | මිරියවෙල |
| 09. | නිමල් දසනායක | මිරියවෙල |
| 10. | ජී.එච්.ජී. නිරංජලා කුමාරි | මිරියවෙල |
| 11. | එම්.ජී. ධර්මසේන | මිරියවෙල |
| 12. | එම්.ජී. මාලනී මැණිකේ | මිරියවෙල |

බලයලත් මිනින්දෝරු එච්.එම්.ආර්.ටී.කේ. හේරත් මයාගේ 2016.02.23 දින මනින ලද පිඹුරුපත් අංක 45/2016 දරන පිඹුරුපත අනුව වේ.

එච්.එම්.ආර්.ටී.කේ.හේරත්,
බලයලත් මිනින්දෝරු තලමිතිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු,
පින්නවල, රඹුක්කන.
ලියාපදිංචි අංකය: 19831492

# කරඟංපිටිගොඩ මිහිරිය වෙල්යාය මාර්ගය

පිඹුරු අංකය: 45/2016

පරිමාණය 1:1000




විස්තරය
නි - නියර
ආතා - ආධාරක තාප්පය
මාර්ග(ප්‍රා.ස.) - මාර්ගය(ප්‍රාදේශීය සභා)

සබරගමුව පළාතේ
කෑගල්ල දිස්ත්‍රික්කයේ
ගල්බඩ කෝරළේ තුන්පළාත පත්තුවේ
කරඟංපිටිගොඩ ගමේ පිහිටි දාසයගොඩ, අටවල සහ මීරියවෙල යන ඉඩම් හරහා පවතින මාර්ගය මැන සාදන ලද

-පිඹුරු-

| කැබලි අංකය | මාර්ගයේ වර්ග ප්‍රමාණය | | | | දිග(මීටර) | පළල(අඩි) | කිවයුතු කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | හෙක්ටයාර | අ | රූ | පර | | | |
| 1 | 0.1060 | 00 | 1 | 01.91 | 290.00 | 12 | |

මනින ලද්දේ : 2016.02.23 වන දින

සත්‍ය පිටපතක් බව සහතික කරමි
(අත්සන)
ලේකම්
අරණායක ප්‍රාදේශීය සභාව

(අත්සන)
23-02-2016

එච්.එම්.ආර්.ටී.කේ. හේරත්
බලයලත් මිනින්දෝරු තලමිතිකරු
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු
ටෙලි : 035-2266422/077 4973610
ලි.ප. අංකය: 19831492

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 24 (01) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (01) වැනි වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල හිමිකරුවන් ලෙස අයත් ඉඩම් හිමිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පල වූ දිනයේ සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය නිවේදනය කිරීම ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (02) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

02. මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරෝධතාවයක් නොවුණහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටී. එම්. ගාමිණී තෙන්නකෝන්,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

ලියාපදිංචි කළ යුතු මාර්ග

| *අනු. අංක* | *ග්‍රාම නිලධාරි* | *මාර්ගයේ නම* | *ආරම්භය* | *අවසානය* | *වම්පස පදිංචිකරුවන්* | *දකුණුපස පදිංචිකරුවන්* | *දිග (මීටර්)* | *පළල (අඩි)* |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | කිරිවවුල නැගෙනහිර | වරකාගොඩ වලව්වත්ත හරහා වැටඅස්ස ජනපද මාර්ගය | රෝයල් ටෙරස් ඉඩම | වැටඅස්ස ජනපදය | පී.ජී.චන්ද්‍රදස මයා<br>ඩී.පී.සිරිල් අබේකුමාර මයා<br>ආර්.එම්.කේ.එච්.කේ. රත්නායක මයා<br>ජේ.ඒ.ආනන්ද දයාරත්න මයා<br>පි.ජි.සුනිල්<br>එච්.ඩබ්ලිව්.අනුෂා ප්‍රියංගනි<br>එම්.ජී.පියරත්න මයා<br>බී.ජී.එන්.එස්.කේ. බෝකොටුව<br>පී.ජී.ප්‍රසන්න කරුණාරත්න | එල්.වරකාගොඩ මයා<br>එස්.එම්.බී.එම්.එස්. ආර්.කේ.මකුලාලුව මයා | 400 | 8 |
| 2 | යාලේගොඩ බටහිර | ගල්ලෙනවත්ත මාර්ගය | එම්. ජී. ඩබ්ලිව්. මහවත්ත මහතාගේ ඉඩම | ඒ. පී. යු. කැප්පෙටිපොල මහතාගේ ඉඩම | ඒ. පී. යු. කැප්පෙටිපොල මයා | එම්.ජී. ඩබ්ලිව්. මහවත්ත මයා | 200 | 10 |
| 3 | හිද්දවුල්ල බටහිර | මල්වත්ත ජනපද මාර්ගය | කමතේ සිට | බළුගොල්ල වත්ත | ඩී.පී.ජේන්නෝන් මිය<br>ඒ.ජී.එස්.ආර්.කුමාර මයා<br>එස්.ඒ.ජී.යු.සුනිල් රෝහන කුමාර මයා<br>අනුර කුමාර මයා<br>ආර්.එම්.බී.ආර්. රත්නායක මයා<br>එච්.එම්.කේ.ජී. තිලකාවතී මිය | ජේ.පී.සයිමන් මයා<br>එච්.ජී.පද්මලතා කරුණාරත්න මිය | 100 | 10 |

## ගිරිබාව ප්‍රාදේශීය සභාව

### සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගැනීම

**1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

261 වැනි අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ගිරිබාව ප්‍රාදේශීය සභාව විසින් 2019 ජූලි මස 11 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 06/2019/15/20/01 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
ඊ. එම්. ආනන්ද රූපසිංහ,
ගිරිබාව ප්‍රාදේශීය සභාව.

2019 ජූලි මස 11 වැනි දින ගිරිබාව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දීය.

*යෝජනාව*

1989 අංක දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය යටතේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2010.07.16 වැනි දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පල කරනු ලැබූ වයඹ පළාතේ පළාත් සභාව විසින් ස්ථිර කරන ලද 2011.07.16 වන දින අංක 1763/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පල කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරනලද්ද වූද ප්‍රාදේශීය සභාවල අප්‍රසන්න, අන්තරාදයක සහ අප්‍රසන්න, අන්තරාදයක වෙළඳාම් කටයුතු පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,සංචාරක වෙළඳාම් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව, ප්‍රාදේශීය සභා සීමාව තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, ප්‍රාදේශීය සභා සීමාව තුළ පාරවල් සහ මංමාවත් සැරසිලි කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, ලැගුම් නිවාස හා නවාතැන් පොළවල් පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා, යන අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන(සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ ගිරිබාව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

10-497

---

## වරකාපොල ප්‍රාදේශීය සභාව

### 2020 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

වරකාපොල ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 05 වන දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක ඉ-03 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම්, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවද වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහාවන සම්පූර්ණ වරිපනම් 2020 වර්ෂයේ ජනවාරි මස 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද එක් එක් කාර්තුවකට අද ාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට පෙරාතුව ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

සභාපති,
වරකාපොල ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 16 වන දින,
වරකාපොල ප්‍රාදේශීය සභාව,
වරකාපොල.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට පැවරි ඇති බලතල ප්‍රකාර වරකාපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි සියලුම නිවාසවල ගොඩනැගිලිවල ඉඩම් වල හා ගෙපත්වල 2019 වර්ෂයේ වාර්ෂික තක්සේරු වටිනාකම් පහත 01 වන උපලේඛනයේ පරිදි 2020 වර්ෂය සඳහා පිළිගැනීමටත්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර වරකාපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් සහ ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උප වගන්තියේ විධි විධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හරකින් ගෙවීමට විධාන කිරීමටත් වරකාපොල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

වරිපනම් බදු - 2020 වර්ෂය සඳහා

| *කාර්තුව* | *ගෙවිය යුතු දිනය* | *5% වට්ටම සඳහා හිමිකම් කියන අවසාන දිනය* |
|---|---|---|
| පළමු වන කාර්තුව | 2020 ජනවාරි 01 සිට මාර්තු 31 දක්වා | 2020 ජනවාරි 31 |
| දෙවන කාර්තුව | 2020 අප්‍රේල් 01සිට ජුනි 30 දක්වා | 2020 අප්‍රේල් 30 |
| තුන්වන කාර්තුව | 2020 ජූලි 01 සිට සැප්තැම්බර් 30 දක්වා | 2020 ජූලි 31 |
| හතරවන කාර්තුව | 2020 ඔක්තෝබර් 01 සිට දෙසැම්බර් 31 දක්වා | 2020 ඔක්තෝබර් 31 |

01 වන උපලේඛනය

| | |
|---|---|
| අගුරුවැල්ල පාර වම/දකුණ | 9% |
| කොළඹ පාර වම/දකුණ | 9% |
| නුවර පාර වම/දකුණ | 9% |
| මීරිගම පාර වම/දකුණ | 9% |
| ඇත්නාවල පාර වම/දකුණ | 7% |
| මාදෙනිය පාර වම/දකුණ | 7% |
| පිළාඩුව පාර වම/දකුණ | 7% |
| පන්සල පාර වම/දකුණ | 7% |
| රෝහල් පටුමග පාර වම/දකුණ | 7% |
| මෙනේරිපිටිය පාර වම/දකුණ | 7% |
| නැව්ගල පාර වම/දකුණ | 7% |
| පළමු පටුමග පාර වම/දකුණ | 7% |
| අලව්ව පාර වම/දකුණ | 7% |
| අඹේපුස්ස පාර වම/දකුණ | 7% |
| දේවාල පාර වම/දකුණ | 7% |
| අලව්ව පාර තුල්හිරිය පාර වම/දකුණ | 6% |

*දියුණු ගම් ප්‍රදේශ :*

*දූදිගම*

| | | |
|---|---|---|
| * | ජයලත් කන්ද පාර වම/දකුණ | 6% |
| * | ගලපිටමඩ පාර වම/දකුණ | 6% |
| * | නෙළුන්දෙනිය පාර වම/දකුණ | 6% |

*නෙලුන්දෙනිය*

* අලව්ව පාර වම/දකුණ 6%
* කොළඹ පාර වම/දකුණ 6%
* දූදිගම පාර වම/දකුණ 6%
* නුවර පාර වම/දකුණ 6%

*වාරියගොඩ*

* නෙළුන්දෙනිය පාර වම/දකුණ 6%
* කොළඹ පාර වම/දකුණ 6%

*තල්ලියැද්ද*

තල්ලියැද්ද පාර වම/දකුණ 6%

*ඩඩ්ලි සේනානායක මාවත*

* දේවාල පටුමග වම/දකුණ (අඹේපුස්ස) 6%
* ඩඩ්ලි සේනානායක මාවත වම/දකුණ 6%

*අඹගල පාර*

* මස්ජිඩ් මාවත වම/දකුණ 6%
* අඹගල පාර වම/දකුණ 6%

*තුංතොට*

* අරන්දර පාර වම/දකුණ 6%
* ගලපිටමඩ පාර වම/දකුණ 6%
* නෙළුන්දෙනිය පාර වම/දකුණ 6%

10-499/1

---

## වරකාපොල ප්‍රාදේශීය සභාව

### 2020 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

වරකාපොල ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 05 වැනි දින සිට පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 03 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද, මාර්තු 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 වන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ. 2020 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2020 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

සභාපති,
වරකාපොල ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 18 වැනි දින,
වරකාපොල ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

1987 අංක 5 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වරකාපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද, ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ ද,

*(අ)* හෙක්ටයාර 05 ක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරක් ම මත 2020 වර්ෂය සඳහා රුපියල් දහය (10) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

*(ආ)* ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් වරකාපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) වැනි කොටසේ 1989 පෙබරවාරි 03 (අ) දිනැති ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති හෙයින් හෙක්ටයාර් පහට අඩු සෑම ඉඩමක් මතම 2020 වර්ෂය සඳහා රුපියල් පනහ බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට සහ

*(ඇ)* ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යැයිද වරකාපොල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

| *කාර්තුව* | *ගෙවිය යුතු දිනය* | *5% වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
|---|---|---|
| පළමුවන කාර්තුව | 2020 ජනවාරි 01 සිට මාර්තු 31 දක්වා | 2020 ජනවාරි 31 |
| දෙවන කාර්තුව | 2020 අප්‍රේල් 01 සිට ජුනි 30 දක්වා | 2020 අප්‍රේල් 30 |
| තුන්වන කාර්තුව | 2020 ජූලි 01 සිට සැප්තැම්බර් 30 දක්වා | 2020 ජූලි 31 |
| හතරවන කාර්තුව | 2020 ඔක්තෝබර් 01 සිට දෙසැම්බර් 31 දක්වා | 2020 ඔක්තෝබර් 31 |
| | | |

10-499/2

---

## කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1)(ආ) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර දකුණු පළාත් සභාවේ මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව විසින් මෙකී පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරුද්ධත්වයක් පල කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියාකරන ලෙසට දන්වන අතර, ඉදිරියේ දී මෙම මාර්ගවලට අයත් ඉඩම්වලින් අදාල බිම් ප්‍රමාණය අත්පත් කර ගැනීමට කටයුතු යොදන බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

සභාපති/ලේකම්,
ප්‍රාදේශීය සභාව,
කඹුරුපිටිය.

**කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව**

*මාර්ග ලියාපදිංචි කිරීම*

| *පාරේ නම* | *ග්‍රාම නිලධාරී වසම* | *දෙපස ඇති ඉඩම්* | | *ආරම්භය* | *අවසානය* | *දුර මීටර්* | *පළල අඩි* |
|---|---|---|---|---|---|---|---|
| | | *වම* | *දකුණ* | | | | |
| 01. ආරිය බුලේගොඩ මාවත | සපුගොඩ | ජාතුංග වත්ත සියඹලාගහ ගෙදර කැතිපිලි තුඩුව වත්ත බෝ කනත්ත | ගොන්න ගස් වත්ත ඉඹුල්ගස් වත්ත බන්ඩරහේන පහල වත්ත | අකුරැස්ස-කඹුරුපිටිය ප්‍රධාන මාර්ගය ජාතුංග වත්ත | මිරිස් වත්ත හන්දිය | 1000 | 12 |
| 02. පොල්ගස්දෙක වත්ත මාර්ගය | සීවැල්ගම | ලිංවලහේන ඉඩම ජලසම්පාදන මුරපොල | පොල්ගස්දෙක වත්ත අංක - 01 කැබැල්ල පොල්ගස්දෙක වත්ත අංක - 11/බී කැබැල්ල පොල්ගස්දෙක වත්ත අංක - 11/සී කැබැල්ල පොල්ගස්දෙක වත්ත අංක - 11/ඒ කැබැල්ල පොල්ගස්දෙක වත්ත අංක - 21 කැබැල්ල | පොල්ගස්දෙක වත්ත අංක - 01 කැබැල්ල සහ ජලසම්පාදන මුරපොල | ලිංවලහේන සීවැල්ගම | 450 | 20 |
| 03. පැරඩයිස් පාර්ක් මාර්ගය | 346/B, පලොල්පිටිය | අංක 22, 21, 20, 19, 18, 1, 2, 3, 4, 5, 6, 7, 8, 9 යන ඉඩම් කැබලි | අංක 24, 14, 17, 16, 15, 12, 10 යන ඉඩම් කැබලි | අංක 22 හා 24 යන කොටස් වලින් | අංක 08 හා 09 දරන ඉඩම් කැබලි වලින් | 300 | 20 |

සභාපති/ලේකම්,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

10 - 498

**හම්බන්තොට මහා නගර සභාව**

2020 වර්ෂයේ වැඩසටහන් අයවැය ලේඛනය

හම්බන්තොට මහා නගර සභාවේ 2020 වර්ෂය සඳහා වූ වැඩසටහන් අයවැය ලේඛනය 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 21 වැනි දින සිට 2019 ඔක්තෝබර් මස 29 වැනි දින දක්වා
(රජයේ නිවාඩු දින සහ ඉරිදා දින හැර) කාර්යාල වේලාව තුළ හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව

252 වන අධිකාරිය වූ මහා නගර සභා ආඥාපනතේ 212 වන වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. ජී. ගාමිණී ශ්‍රී ආනන්ද *(වැ. බ.)*
නගරාධිපති,
මහා නගර සභාව හම්බන්තොට.

2019 ඔක්තෝබර් මස 03 වන දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

10-638

---

**බේරුවල ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 සහ 24(2) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර බස්නාහිර පළාත් සභාවේ, කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවල ප්‍රාදේශීය සභාව විසින් මෙහි 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්ති ප්‍රකාරව බස්නාහිර පළාත් සභාවේ කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත දක්වා ඇති මංමාවත් බේරුවල ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳ ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයින් විසින් හෝ යම් විරුද්ධතාවයන් පල කරනු ලබන්නේනම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් පහත සඳහන් මාර්ගය බේරුවල ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

බී. ඩබ්. එම්. මේනක විමලරත්න,
සභාපති,
බේරුවල ප්‍රාදේශීය සභාව,
අළුත්ගම.

2019 සැප්තැම්බර් මස 20 වැනි දින,
බේරුවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**මාර්ග විස්තරය**

| *පාරේ නම* | *ආරම්භක ස්ථානය* | *අවසන් ස්ථානය* | *පාරේ දිග* | *පාරේ පළල* |
|---|---|---|---|---|
| උතුරු පයාගල දුම්රිය ස්ථානයේ සිට සමුද්‍ර මාවත දක්වා දිවෙන මාර්ගය | උතුරු පයාගල දුම්රිය ස්ථානයේ සිට | සමුද්‍ර මාවත | අඩි 991 | අඩි 15-20 |




පරිමාණය 1 : 2000

බස්නාහිර පළාතේ

කළුතර දිස්ත්‍රික්කයේ

කළුතර තොටමුණ දකුණේ අංක 735 මහපයාගල ග්‍රාම නිලධාරී වසමේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, බේරුවල ප්‍රාදේශීය සභා සීමාව තුළ කුඩා පයාගල සහ මහ පයාගල පිහිටි උතුරු පයාගල දුම්රිය ස්ථානයේ සිට සමුද්‍ර මාවත දක්වා දිවෙන යෝජිත මාර්ග ප්‍රවේශය දැක්වෙන පිඹුර

පිඹුර

මාර්ගයේ පළල - අඩි 15 - 20 (මීටර් 4.5 - 6)
මාර්ගයේ දිග - අඩි 991 (මීටර් 302)

මනින ලද්දේ - 2018-08-13

ලියාපදිංචි බලයලත් මිනින්දෝරු සහ
උසාවි කොමසාරිස්
2019-03-29

Lakshman Serasinghe
Registered Licensed Surveyor

# විවිධ දැන්වීම්

## රත්තොට ප්‍රාදේශීය සභාව

### 2020 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

රත්තොට ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 12 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී යෝජනා අංක 5.1-(iv) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ප්‍රදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2020 වර්ෂයේ ජනවාරි මස 31 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක්ද ගෙවනු ලැබේ.

යූ. ජී. ටී. කුමාරසේන,
සභාපති,
රත්තොට ප්‍රදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 12 වැනි දින,
රත්තොට ප්‍රදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර රත්තොට ප්‍රදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත පිහිටි දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ වල පිහිටි සියළුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම් හා ගෙපත්වල 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද වාර්ෂික තක්සේරු වටිනාකම් 2020 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමෙන්

(i) රත්තොට නගර සීමාව (පැරණි සුළු නගර සභාව) - සියයට දහයක (10%) වරිපනමක් ද
(ii) කයිකාවල නගර සීමාව - සියයට පහක (5%) වරිපනමක් ද

2020 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් සහ

ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (06) වන උපවගන්තියේ විධි විධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් රත්තොට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

10-256/1

---

## රත්තොට ප්‍රාදේශීය සභාව

### 2020 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

රත්තොට ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 12 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී යෝජනා අංක 5.1-(v) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ප්‍රදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2020 වර්ෂයේ ජනවාරි මස 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක්ද එක් එක් කාර්තුවකට අදාළ අක්කර බදු ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක්ද ගෙවනු ලැබේ.

යූ. ජී. ටී. කුමාරසේන,<br>සභාපති,<br>රත්තොට ප්‍රදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 12 වැනි දින,<br>රත්තොට ප්‍රදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර 2019 වර්ෂයේදී බලාත්මක කරන ලද සත්තේක්ෂණය කිරීම 2020 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රත්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියාවූද ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තාවූ ද ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ

*(අ)* හෙක්ටයාර 05 හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මතම 2020 වර්ෂය සඳහා රු. 10 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

*(ආ)* ප්‍රදේශීය සභා පනතේ 134 වන වගන්තියේ 6 වන උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධානය කල යුතු යැයිද රත්තොට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

10-256/2

---

## රත්තොට ප්‍රාදේශීය සභාව

### 2020 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

රත්තොට ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 12 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී යෝජනා අංක 5. 1-(vi) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව රත්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකු ම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2020 වර්ෂය සඳහා මෙම බද්ද රත්තොට ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

යූ. ජී. ටී. කුමාරසේන,<br>සභාපති,<br>රත්තොට ප්‍රදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 12 වැනි දින,<br>රත්තොට ප්‍රදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධාන වලින් ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර රත්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2020 වර්ෂයේදී පහත උප ලේඛනයේ I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුම මතම එහි II වන තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමට රත්තොට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

01.

| | *i* තීරුව | *ii* තීරුව (රු.) |
|---|---|---|
| i. | මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා, | 25 0 |
| | *(අ)* වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| | *(ආ)* වෙළඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 4 0 |
| iii. | සෑම කරත්තයක් සඳහා | 20 0 |
| iv. | සෑම අත්කරත්තයක් සඳහා | 10 0 |
| v. | සෑම රික්ෂෝවක් සඳහා | 7 50 |
| vi. | සෑම අශ්වයෙකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා | 15 0 |
| vii. | සෑම ඇතෙකු සඳහා | 50 0 |

02. විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

10-256/3

---

## රත්තොට ප්‍රාදේශීය සභාව

### 2020 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු අය කිරීම

රත්තොට ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 12 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී යෝජනා අංක 5. 1-(vii) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

යූ. ජී. ටී. කුමාරසේන,
සභාපති,
රත්තොට ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 12 වැනි දින,
රත්තොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියේ (1) වන උපවගන්තිය අනුව රත්තොට ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව රත්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදි කිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක

*(අ)* ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ
*(ආ)* ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමකට යටත් කර නොමැති විටක හෝ
*(ඇ)* ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 1.8 ට වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම් සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2020 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමි ප්‍රාග්ධන අගයෙන් සියයට දශම පහක් (0.5%) ක වාර්ෂික බද්දක් පැනවීමටත් එකී සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බද්ද, 2020 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර රත්තොට ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවට විධානය කළ යුතු යැයි රත්තොට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

10-256/4

---

## රත්තොට ප්‍රාදේශීය සභාව

### 2020 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

රත්තොට ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 12 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී යෝජනා අංක 5 1-(viii) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

යූ. ජී. ටී. කුමාරසේන,<br>
සභාපති,<br>
රත්තොට ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 12 වැනි දින,<br>
රත්තොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නාවූ හෝ කිසියම් ව්‍යාපාරයක් රත්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2020 වර්ෂයේදී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකු විසින්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණය අනුව වූ බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2020 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් රත්තොට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

*උපලේඛනය*

| | *i වන තීරුව*<br>*බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය* | *ii වන තීරුව*<br>*ගෙවිය යුතු බද්ද (රු.)* |
|---|---|---|
| 01. | රු. 6000 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නැත |
| 02. | රු. 6000 ඉක්මවන නමුත් 12000 නොඉක්මවන විට | 90 0 |
| 03. | රු. 12000 ඉක්මවන නමුත් 18750 නොඉක්මවන විට | 180 0 |
| 04. | රු. 18750 ඉක්මවන නමුත් 75000 නොඉක්මවන විට | 360 0 |
| 05. | රු. 75000 ඉක්මවන නමුත් 150000 නොඉක්මවන විට | 1200 0 |
| 06. | රු. 150000 ඉක්මවන විට | 3000 0 |

10-256/5

## රත්තොට ප්‍රාදේශීය සභාව

## කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2020 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

රත්තොට ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 12 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී යෝජනා අංක 5.1-(ix) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ රත්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2020 වර්ෂයේදී රත්තොට ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මත ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

යූ. ජී. ටී. කුමාරසේන,
සභාපති,
රත්තොට ප්‍රදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 12 වැනි දින,
රත්තොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ රත්තොට ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ රත්තොට ප්‍රාදේශීය සභාව විසින් 2020 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 149 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්ත වෙනුවෙන් එම ලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති, එය විසින් අනුමත කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පොලක් වන විට එකී හෝටලයෙන් හෝ ආපන ශාලාවෙන් හෝ නවාතැන්පළෙන් පසුගිය වර්ෂයේ ලත් ලැබීම්වලින් 1% ක ප්‍රමාණයට සමාන ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත් රත්තොට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

*උපලේඛනය*

| *I වන තීරුව* | | *II වන තීරුව* | | |
|---|---|---|---|---|
| | | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්* | | |
| *අනු. අංකය* | *කර්මාන්තයේ ස්වභාවය* | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | උකස් ලියාපදිංචි කිරීම | 500 | 750 | 1000 |
| 02. | ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1000 |
| 03. | ග්‍රැමපෝන් ශබ්ද වාහිනී යන්ත්‍ර ක්‍රියා කරවීම | 500 | 750 | 1000 |
| 04. | හෝටල් | 500 | 750 | 1000 |
| 05. | බත් කඩ, ආපන ශාලා සහ තේ කඩ | 500 | 750 | 1000 |
| 06. | බේකරි | 500 | 750 | 1000 |
| 07. | කිරිපට්ටි හා කිරි වෙළඳාම | 500 | 750 | 1000 |
| 08. | ආහාර විකිණීම | 500 | 750 | 1000 |
| 09. | මාළු විකිණීම | 500 | 750 | 1000 |

| *I වන තීරුව* | | *II වන තීරුව* | | |
|---|---|---|---|---|
| | | *ස්ථානයේ වාර්ෂික වටිනාකම් රුපියල්* | | |
1912 අංක 07 දරන ප්‍රසිද්ධ රඟ දැක්වීම් හා සැණකෙළි පිළිබඳ ආඥාපනතේ 3 අ. (1) වගන්තිය පරිදි ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ 3 අ. (1) අ. ප්‍රකාරව පහත උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තු අය කිරීමටත් එකී පනතේ ප්‍රසිද්ධ රඟ දැක්වීම් යන්නට එකී පනතේ දෙවන වගන්තියේ (අ), (ආ), (ඇ) යන උපවගන්තිවල සඳහන්වන රඟ දැක්වීම් හා සැණකෙළි අදාළවන බවත් යෝජනා කරන්නීය.

*උපලේඛනය - අංක 05*

අ. ප්‍රසිද්ධ නාට්‍යය නිරූපණයක් ද - රු. 5,000.00

ආ. සිනමා යන්ත්‍රයක්, මැජික් ලාම්පුවක් හෝ ඒ ආකාරයේ වෙනයම් උපකරණයක් චිත්‍ර මාර්ගයෙන් ප්‍රදර්ශණය කරනු ලබන චලන ප්‍රකාශනයන් ද - රු. 2,500.00

ඇ. නැටුම්, විජ්ජා, ඉන්ද්‍රජාල, පිනුම් සැම බොක්සින් තරග, සර්කස්, විවිධ ප්‍රසංග හෝ වේදිකා මත කෙරෙන විනෝද ප්‍රසංගයන්ද - රු. 10,000.00

10-403/5

---

## ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තිය (1) වන උපවගන්තිය යටතේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 16 වැනි දින පැවති මහ සභාවේ යෝජනා අංක 05 (01) V යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සුරන්ත ජයලත් වීරසිංහ,
සභාපති,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව,
තුංකම.

**යෝජනාව**

අ. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තිය (1) වන උපවගන්තිය ප්‍රකාරව සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් අනුමත කර ප්‍රකාශයට පත් කරන ලද ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද බල ප්‍රදේශ තුළ පිහිටි කුඹුරු ඉඩම් හැර සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල 2017 වර්ෂයේ දී තක්සේරු කරන ලද තක්සේරුව පළමුවරට 2020 වර්ෂය සඳහා එකී පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාරව පිළි ගැනීමට ද,

ආ. එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් 5% ප්‍රතිශතයක් අය කිරීමට ද,

ඇ. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උපවගන්තියෙන් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව යථෝක්ත වරිපනම් බද්ද 2020 වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දින වලින් අවසන්වන කාර්තු තුළදී සමාන වාරික හතරකින් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව වෙත ගෙවන ලෙස බද්දට යටත් වන සෑම පුද්ගලයකුටම නියම කිරීමට ද,

ඈ. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (7) වන උපවගන්තියෙන් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඉහත කී වර්ෂයට අදළ සම්පූර්ණ වරිපනම් බදු මුදල 2020 වර්ෂයේ ජනවාරි 31 දින හෝ එදිනට පෙර ගෙවනු ලැබුවහොත් 10% ක වට්ටමක් ලබා දීමටද, කිසියම් කාර්තුවක බදු මුදල අදළ කාර්තුවේ පළමු මාසය ඇතුළත ගෙවනු ලබන අවස්ථාවක එකී කාර්තුවේ මුදලින් 5% වට්ටමක් ලබා දීමට ද යෝජනා කරන්නීය.

10-403/6

## ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව

### 2020 වර්ෂයට අදළව සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වන වගන්තිය යටතේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 16 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී යෝජනා අංක 05 (1) (VI) යටතේ පහත සඳහන් යෝජනා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. සුරන්ත ජයලත් වීරසිංහ,
සභාපති,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව,
තුංකම.

2019 ඔක්තෝබර් මස 02 වැනි දින,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 විධිවිධාන ප්‍රකාරව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ දියුණු ගම් ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ප්‍රදේශ තුළ පිහිටා ඇති පර්. 20 ට වැඩි සංවර්ධනය නොකළ ඉඩම් වන විට,

- අ. එම ඉඩමේ කිසිදු ගොඩනැගිල්ලක් ඉදිකර නොමැති වූ විට; හෝ
- ආ. සැබැවින් ම ගොඩනැගිලිවලින් ආවරණය වූ බිම් ප්‍රමාණය සමානුපාතය වශයෙන් 1.5ක් විය යුතු බවටත්,
- ඇ. ඒ ඉඩම විධිමත් හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් නොවන විට,

එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් 0.001% වන බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත් එම බද්දේ කාර්යය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 153 (1) (ඇ) ඡේදය යටතේ යෝජනා කරන්නීය.

විධිමත් හෝ නිත්‍ය ලෙස වගා කිරීම යනු එක් එක් වගාවට අදාළ රාජ්‍ය ආයතන විසින් ප්‍රකාශයට පත් කර ඇති වගාව වන්නේ ය.

10-403/7

---

## ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව

### 2020 වාර්ෂික සේවා ගාස්තු පැනවීම

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සඳහා 2020 වර්ෂයට සේවා ගාස්තු පැනවීම වෙනුවෙන් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 16 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී යෝජනා අංක 05 (1) VII යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. සුරන්ත ජයලත් වීරසිංහ,
සභාපති,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව,
තුංකම.

2019 ඔක්තෝබර් මස 02 වැනි දින,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව මගින් සඳහන් පහත අංක VII වැනි උපලේඛනයෙහි 1 වැනි තීරුවෙහි සඳහන් සේවා සැලසීම වෙනුවෙන් II වැනි තීරුවෙහි සඳහන් පරිදි 2020 වර්ෂය සඳහා සේවා ගාස්තු අය කිරීම කළ යුතු බව ප්‍රාදේශීය සභාව විසින් යෝජනා කරන්නීය.

*උපලේඛනය අංක 06*

| අනු. අංක | I වැනි තීරුව | II වැනි තීරුව රු. |
|---|---|---|
| 01 | වීරීරේබා හා නොපරවා ගැනීමේ සහතිකයක් නිකුත් කිරීමේ සේවා ගාස්තු | 1,000.00 |
| 02 | ආදහනයක් සිදු කර ගැනීමේ සේවා ගාස්තු | |
| | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත | 7,000.00 |
| | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත | 8,000.00 |
| 03 | ජල අනුකූලතා සහතිකයක් නිකුත් කිරීමේ සේවා ගාස්තු | 150.00 |
| 04 | ගොඩනැගිලි අයදුම්පතක් නිකුත් කිරීමේ සේවා ගාස්තු | 500.00 |
| 05 | අනතුරුදායක ගස් ඉවත් කිරීමේ පෝරම නිකුත් කිරීමේ සේවා ගාස්තු | 500.00 |
| 06 | ජලනල එළීම සඳහා මාර්ග පළුදු කිරීම | |
| | (1) කොන්ක්‍රීට් පාරක් අඩි 1 ක් පළලට පළුදු කිරීම සඳහා (මීටරයකට) | 1,650.00 |
| | (2) තාර පාරක් අඩි 01 ක් පළලට පළුදු කිරීම සඳහා (මීටරයකය) | 1,150.00 |
| | (3) බොරළු පාර අඩි 1 පළලට පළුදු කිරීම සඳහා (මීටරයකට) | 650.00 |
| | (4) තාර/කොන්ක්‍රීට් පාර යටින් විද නලයක් එළීම සඳහා (මීටරයකට) | 750.00 |
| | (5) මාර්ගයේ උරහිස අසලින් වලක් කැපීම සඳහා | 450.00 |

07 නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව ගොඩනැගිලි ඉදි කිරීම/කොටස් එකතු කිරීම/නැවත ඉදි කිරීම.

| | *ඉදි කිරීමේ අදියර* | *නේවාසික වර්ග මීටර් රු: ශත:* | *වාණිජ වර්ග මීටර් 1 රු: ශත:* |
|---|---|---|---|
| 01. | අත්තිවාරමේ වැඩ පමණක් (කයිරු මට්ටම) සම්පූර්ණ කොට ඇති විට | 200.00 | 500.00 |
| 02. | වහලය මට්ටම දක්වා (වහල රහිතව) | 300.00 | 1,000.00 |
| 03. | වහලය ඇතුළුව ඉදි කොට ඇති විට | 400.00 | 1,500.00 |
| 04. | සම්පූර්ණයෙන් ඉදි කොට ඇති විට | 500.00 | 2,000.00 |
| 05. | මායිම් තාප්ප/ ආරක්ෂිත බැම්ම ඉදි කොට ඇති විට | 400.00 | 400.00 |
| 06. | දුරකතන/විදුලි සංදේශ කුළුනු සඳහා සෑම මීටර 05 කටම | 10,000.00 බැගින් | |
| 07. | විශේෂ සංවර්ධන ව්‍යාපෘති සෑම මිලියන 05 කටම | 10,000.00 බැගින් | |

10-403/8

## ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව

### 2020 වර්ෂය සඳහා සභාවට අයත් දේපළ කුලියට දීමේ ගාස්තු අය කිරීම

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සඳහා 2020 වර්ෂයට යන්ත්‍ර සූත්‍ර කුලියට දීමේ ගාස්තු පැනවීම වෙනුවෙන් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 16 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී යෝජනා අංක 05 (1) (VIII) යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. සුරන්ත ජයලත් වීරසිංහ,<br>
සභාපති,<br>
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව,<br>
තුංකම.

2019 ඔක්තෝබර් මස 02 වැනි දින,<br>
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍ර සූත්‍ර කුලියට දීම වෙනුවෙන් මෙහි පහත උපලේඛනයේ අංක 07 1 වැනි තීරුවේ සඳහන් එක් එක් වාහන හා යන්ත්‍ර සූත්‍ර සඳහා අංක 11 තීරුවෙහි ගාස්තු 2020 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව විසින් යෝජනා කරන්නීය.

*උපලේඛනය - අංක 07*

| *අනු. අංකය* | *I වන තීරුව-විස්තරය* | *II තීරුව - ගාස්තුව (රුපියල්)* |
|---|---|---|
| 01. | මෝටර් ග්‍රේඩරය | පැයකට 2800 (ඉන්ධන රහිතව) |
| 02. | බැකෝ යන්ත්‍රය | පැයකට 1500 (ඉන්ධන රහිතව) |
| 03. | ඩබල් ඩ්‍රම් මාර්ග තලනය | පැය 08ක දිනයකට 3,000 (ඉන්ධන රහිතව) |
| 04. | ප්ලේට් කම්පැක්ට් යන්ත්‍රය | පැය 08ක දිනයකට 1,500 (ඉන්ධන රහිතව) |
| 05. | ටිපර් රථය | පැය 08ක දිනයකට 3,500 (ඉන්ධන රහිතව) |
| 06. | ට්‍රැක්ටරය | දිනකට රු.3,000 |
| 07. | ගලි බවුසරය | ව්‍යාපාර ඒකක .4,500<br>ගෘහ ඒකක 3,500<br>ප්‍රවාහනය සඳහා කි. මී. 1ට රු. 65 බැගින් ගෙවිය යුතුය |
| 08. | ජල බවුසරය | දිනකට 1,000<br>ප්‍රවාහනය සඳහා කි. මී. 1ට රු. 65 බැගින් ගෙවිය යුතුය. |
| 09. | ක්‍රීඩා පිටි හා සතිපොළ | දේශපාලන රැස්වීම් සඳහා දිනකට 2,000<br>සංගීත සංදර්ශන සඳහා දිනකට 4,000<br>අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් සඳහා දිනකට 2,000 |

10-403/09

## බළන්ගොඩ ප්‍රාදේශීය සභාව

### 2020 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

බළන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 05.01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ බළන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 149 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2020 වර්ෂය සඳහා පනවන ලද බලපත්‍ර ගාස්තු එම වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවට වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. සුනිල් ප්‍රේමසිරි,
සභාපති,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 20 වැනි දින,
දිගදුර,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ දීය.

**යෝජනාව**

බළන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ බළන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 149 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පහත උපලේඛනයෙහි 1 වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා බළන්ගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2020 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් බළන්ගොඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| *I තීරුව* | | *II තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *බලය දෙනු ලබන කාර්යය* | *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 1. | උකස්කරුවන් | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | ශබ්දවාහිනී ක්‍රියා කරවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | හෝටල් | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | බත්කඩ, ආපන ශාලා සහ තේ, කෝපි කඩ | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | බේකරි | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | කිරිපිටි හා කිරි වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | ආහාර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | මාළු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | මස් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | අයිස් කර්මාන්ත ශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | සිසිල් බීම කර්මාන්ත ශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ලොන්ඩරි | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | සංචාරක වෙළෙන්දෝ | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ගවගාල් | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | බාබර් සාප්පුවක් | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | ලැගුම් හල් | 500 0 | 750 0 | 1,000 0 |

10-501/1

## බළන්ගොඩ ප්‍රාදේශීය සභාව

### 2020 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

බළන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 05.01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.
2020 වර්ෂය සඳහා පනවන ලද ව්‍යාපාර බද්ද එම වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත් වැඩිදුරටත් නිවේදනය කරමි.

එම්. එම්. සුනිල් ජේමසිරි,
සභාපති,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 20 වැනි දින,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව,
දිගදුර.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(1) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් බළන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2020 වර්ෂයේදී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2020 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2020 වර්ෂයේ මාර්තු 31 දිනට පෙර බළන්ගොඩ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව බළන්ගොඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛනය*

| *I තීරුව* | *II තීරුව* |
|---|---|
| *2019 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම* | *රු. ශ.* |
| රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නොමැත |
| රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක | 90 0 |
| රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට | 180 0 |
| රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට | 360 0 |
| රු. 75,000 ඉක්මවන නමුත් රු. 150,000 නොඉක්මවන විට | 1,200 0 |
| රු. 150,000 ඉක්මවන විට | 3,000 0 |

10-501/2

## බළන්ගොඩ ප්‍රාදේශීය සභාව

### 2020 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

බළන්ගොඩ ප්‍රදේශීය සභාව විසින් 2019 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 05.01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.
1987 අංක 15 දරන ප්‍රාදේශය සභා පනතේ 134(1) වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2020 වර්ෂය සඳහා පනවන ලද වරිපනම් බද්ද සෑම කාර්තුවක් තුළදීම සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. සුනිල් ජේමසිරි,
සභාපති,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 20 වැනි දින,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව, දිගදුර.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ 1 වන උපවගන්තිය යටතේ බළන්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බළන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත් කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකමින් සියයට තුනක (3%) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තව ද, 2020 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්දක් බළන්ගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද එම වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල බළන්ගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් කාර්තුවකට අදාළ මුදලින් සියයට පහක (5%) වට්ටමක් ද ලබා දීමට බළන්ගොඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛනය*

| *කාර්තුව* | *ගෙවිය යුතු දිනය* | *5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
|---|---|---|
| පළමු වන කාර්තුව | 2020 මාර්තු 31ට පෙර | 2020 ජනවාරි 31 ට පෙර |
| දෙවන කාර්තුව | 2020 ජුනි 30ට පෙර | 2020 අප්‍රේල් 30 ට පෙර |
| තුන්වන කාර්තුව | 2020 සැප්තැම්බර් 30ට පෙර | 2020 ජූලි 31 ට පෙර |
| හතරවන කාර්තුව | 2020 දෙසැම්බර් 31ට පෙර | 2020 ඔක්තෝබර් 31 ට පෙර |

10-501/3

---

## බළන්ගොඩ ප්‍රාදේශීය සභාව

### 2020 වර්ෂය සඳහා වාර්ෂික අක්කර බදු පැනවීම

බළන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 05.01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2020 වර්ෂය සඳහා පනවන ලද අක්කර බද්ද සෑම කාර්තුවක් තුළදීම සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. සුනිල් ප්‍රේමසිරි,<br>
සභාපති,<br>
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 20 වැනි දින,<br>
දිගදුර,<br>
බළන්ගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව බළන්ගොඩ ප්‍රාදේශීය සභා සීමා ඇතුළත පිහිටියා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ හෙක්ටයාර එකක් මත 2010 වර්ෂය සඳහා රුපියල් දහයක් (10.00) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකළ යුතු බවටත්,

තවද, ඉහත කී පනතේ 134 වන වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් අක්කර බද්ද නියම කිරීමේ හා අයකිරීමේ කාර්යය සඳහා විශේෂ ප්‍රදේශයක් වශයෙන් සළකනු ලබන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක IV (ආ) වන කොටසේ හා 1989.02.03 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති නියමය ඇතුළත් බළන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර පහකට අඩු ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ සෑම ඉඩමක් වෙනුවෙන්ම, එකී ඉඩමේ හෙක්ටයාර එකක් සඳහා 2020 වර්ෂයට රුපියල් පනහක් (රු.50.00) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමත්,

තවද, 2020 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික අක්කර බද්ද බළන්ගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික අක්කර බද්ද 2020 වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ අක්කර බදු මුදල බළන්ගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට අදාළ මුදලින් සියයට පහක (5%) ක වට්ටමක් ද ලබා දීමට බළන්ගොඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛනය*

| *කාර්තුව* | *ගෙවිය යුතු දිනය* | *5% වට්ටම් සඳහා හිමිකම ලබන අවසාන දිනය* |
|---|---|---|
| පළමුවන කාර්තුව | 2020 මාර්තු 31 ට පෙර | 2020 ජනවාරි 31 ට පෙර |
| දෙවන කාර්තුව | 2020 ජුනි 30 ට පෙර | 2020 අප්‍රේල් 30 ට පෙර |
| තුන්වන කාර්තුව | 2020 සැප්තැම්බර් 30 ට පෙර | 2020 ජූලි 31 ට පෙර |
| හතරවන කාර්තුව | 2020 දෙසැම්බර් 31 ට පෙර | 2020 ඔක්තෝම්බර් 31 ට පෙර |

10-501/4

---

## බළන්ගොඩ ප්‍රාදේශීය සභාව

### 2020 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

බළන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 05.01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 148 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2020 වර්ෂයට අදාළව මාර්තු මස 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. සුනිල් ප්‍රේමසිරි,
සභාපති,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 20 වැනි දින,
දිගදුර,
බළන්ගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 148 වන වගන්තිය යටතේ පහත උපලේඛනයේ දැක්වෙන අනු ප්‍රමාණය අනුව වාහන හා සතුන් පිළිබඳ බද්ද 2020 වර්ෂය සඳහා පනවා අය කරන බවද එකී පනත අනුව මෙම මුදල් 2020 වර්ෂයට අදාළව මාර්තු මස 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද බළන්ගොඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| | *රු.* | *ශ.* |
|---|---|---|
| මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක්, හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා කාර්තුව | 25 | 0 |
| සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල්, කාරයක් හෝ කරත්තයක් සඳහා | | |
| (අ) වෙළෙඳ කාර්යය සඳහා යොදවන්නේ නම් | 18 | 0 |
| *(ආ)* වෙළඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම් | 4 | 0 |
| සෑම කරත්තයක් සඳහා | 20 | 0 |
| සෑම අත්කරත්තයක් සඳහා | 10 | 0 |
| සෑම රික්ෂෝවක් සඳහා | 7 | 50 |
| සෑම අශ්වයෙකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා | 15 | 0 |
| සෑම ඇතකු සඳහා | 50 | 0 |

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන වීල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත්කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ ''වෙළෙඳ කාර්ය'' යන්නට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් *නැතහොත්* කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත *නැතහොත්* මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

10-501/5

---

## බළන්ගොඩ ප්‍රාදේශීය සභාව

### 2020 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

බළන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ අගෝස්තු 15 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 05.01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. සුනිල් ප්‍රේමසිරි,
සභාපති,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 20 වැනි දින,
දිගදුර,
බළන්ගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව බළන්ගොඩ ප්‍රාදේශීය සභා සීමා තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට දෙකක් (2%) වන බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එම බද්දේ කාර්යය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153(1) (ආ) ඡේදය යටතේ වන ''සමානුපාතය'' වශයෙන් එම ඉඩමේ ගොඩනැගිලිවලින් ආවරණය වූ බිම් ප්‍රමාණය සහ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර අනුපාතය 5:1 විය යුතු බව බළන්ගොඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

10-501/6

---

## බළන්ගොඩ ප්‍රාදේශීය සභාව

### 2020 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීම

බළන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 05.01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. සුනිල් ප්‍රේමසිරි,
සභාපති,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 20 වැනි දින,
දිගදුර,
බළන්ගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ බළන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් ඉඩමක වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයෙක් හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් හෝ විකුණනු ලබන අවස්ථාවකදී හෝ එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකකට (1%) සමාන බද්දක්

විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයෙක් හෝ අනු නියෝජිතයා විසින් එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් බළන්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු අතර පොදු කටයුතු සඳහා 10% ක ඉඩම් කොටසක් ලබාදිය යුතු බව බළන්ගොඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

10-501/7

## බළන්ගොඩ ප්‍රාදේශීය සභාව

### 2020 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව බදු පැනවීම

බළන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. සුනිල් ප්‍රේමසිරි,
සභාපති,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 20 වැනි දින,
දිගදුර,
බළන්ගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව 1988.08.23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* නිවාස හා ඉදිකිරීම් ගරු ඇමතිතුමා අතින් අනුමත කොට ප්‍රකාශයට පත් කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර බළන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් වීදියකට පාරකට ඇළකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයෙහි දැක්වෙන ආකාරයට බලපත්‍ර ගාස්තුවක් අය කිරීමට බළන්ගොඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

***ඉහත කී උපලේඛනය***

| | *විස්තරය* | *රු. ශ.* |
|---|---|---|
| 1. | බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන (චිත්‍රපට දර්ශන දැන්වීම් හැර) ඕනෑම දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම | 70 0 |
| 2. | බිත්තියක හෝ පුවරුවක ලෑල්ලක් හෝ ආධාරයකයක් මගින් ප්‍රදර්ශනය කරන ප්‍රතිදීප්ත ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම | 120 0 |
| 3. | සෑම වර්ගයකම ප්‍රචාරක බැනරයක් සඳහා සෑම වර්ග අඩියකටම | 70 0 |
| 4. | වෙළෙඳ ව්‍යාපාරික ස්ථානයේ ප්‍රචාරක පුවරුවෙහි තම වෙළෙඳ ව්‍යාපාරයේ නම ප්‍රචාරය කරනු ලබන ස්ථානය හැර (උපරිම වර්ග අඩි 10 ක ප්‍රමාණයට යටත්ව) ඊට අමතරව ප්‍රචාරය කරනු ලබන වෙළෙඳ ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම | 10 0 |

10-501/8

## බළන්ගොඩ ප්‍රාදේශීය සභාව

### 2020 වර්ෂය සඳහා වෙනත් ගාස්තු පැනවීම

බළන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 05.01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. සුනිල් ප්‍රේමසිරි,
සභාපති,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 20 වැනි දින,
දිගදුර,
බළන්ගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු අය කිරීමට බළන්ගොඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛනය*

| | | රු. ශ. |
|---|---|---|
| 1. | ජල සහතිකයක් නිකුත් කිරීම සඳහා | 500 0 |
| 2. | විදුලි සහතිකයක් නිකුත් කිරීම සඳහා | 500 0 |
| 3. | බලපත්‍රයක් පිට ඝාතනය කරනු ලබන එළ ගවයෙකු සඳහා | 1,500 0 |
| 4. | බලපත්‍රයක් පිට ඝාතනය කරනු ලබන එළුවෙකු, ගවයෙකු සඳහා | 1,500 0 |
| 5. | අන්තරදායක ගස් ඉවත් කිරීම සඳහා පරීක්ෂණ ගාස්තු | 1,000 0 |
| 6. | මාර්ගය පළුදු කිරීමේදී ලබා ගන්නා ගාස්තුවෙන් ආපසු ලබා නොදෙන ස්ථාවර ගාස්තුව | 1,000 0 |

10-501/9

---

**බළන්ගොඩ ප්‍රාදේශීය සභාව**

2020 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

බළන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 05.01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. සුනිල් ප්‍රේමසිරි,
සභාපති,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 20 වැනි දින,
දිගදුර,
බළන්ගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1947 අංක 12 දරන විනෝද බදු ආඥා පනතේ ජීඑල්/7/3/4/49 හා 1999.11.24 දිනැති පළාත් සභා හා පළාත් පාලන ලේකම්ගේ ලිපියෙන් සංශෝධනය වූ පළමුවන වගන්තිය අනුව 2020 වර්ෂයට අදාළ පහත උපලේඛනයේ සඳහන් පරිදි විනෝද බදු නියම කිරීමට බළන්ගොඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛනය*

1. අලෙවි කරන ප්‍රවේශ පත්‍ර ආදායමෙන් 20%ක් බැගින්

10-501/10

---

**බළන්ගොඩ ප්‍රාදේශීය සභාව**

2020 වර්ෂය සඳහා ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීමේ ගාස්තු අය කිරීම

බළන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 05.01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. සුනිල් ප්‍රේමසිරි,
සභාපති,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 20 වැනි දින,
දිගදුර,
බළන්ගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*යෝජනාව*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 21. 49, 78 වැනි වගන්ති වලින් පැවරී ඇති බලතල ප්‍රකාරව 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරනු ලදුව (268 වැනි අධිකාරිය වන) නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ වගන්ති වලින් පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයට අදාළව පහත උපලේඛනයේ පරිදි ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීමේ ගාස්තු නියම කිරීමට බළන්ගොඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

1. ගොඩනැගිලි සැළසුම් අනුමත කිරිම.

| ගෙබිම විශාලත්වය වර්ග අඩි | නේවාසික රු. ශ. | වාණිජ හෝ වෙනත් භාවිතය සඳහා රු. ශ. |
|---|---|---|
| 500 අඩු | 1.50 | 3.00 |
| 501-1000 | 1.80 | 3.50 |
| 1001-2000 | 2.00 | 4.00 |
| 2001-3000 | 2.20 | 4.50 |
| 3001-5000 | 2.70 | 4.75 |
| 5001-7500 | 3.00 | 5.00 |
| 7501-10000 | 3.50 | 5.50 |
| 10000 ට වැඩි | 4.00 | 6.00 |

| | | |
|---|---|---|
| 2. | ගොඩනැගිලි සීමා හා නොපරවා ගැනීමේ සහතික නිකුත් කිරීම | රු. 1,000 0 |
| 3. | පිඹුරු පතක් අනුමත කිරීම | රු. 300 0 |
| 4. | ගොඩනැගිලි සැළසුම් අයදුම් පත්‍ර ගාස්තු | රු. 250 0 |
| 5. | ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අයදුම් පත්‍ර ගාස්තු | 25 0 |
| 6. | අනුකූලතා සහතික පත්‍ර ගාස්තු | රු. 500 0 |

10-501/11

---

**බළන්ගොඩ ප්‍රාදේශීය සභාව**

2020 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

බළන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 05. 01 යටතේ පහත දැක්වෙන යෝජනා සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. සුනිල් පේමසිරි,
සභාපති,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 20 වැනි දින,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව,
දිගදුර.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 (1) වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කර්මාන්ත බදු නියම කිරීම, 2020 වර්ෂය සඳහා පනවන ලද කර්මාන්ත බද්ද එම වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියෙන් (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බළන්ගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපඛේනයේ I වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2020 වර්ෂය සඳහා නියම විය යුතු බව වැඩිදුරටත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

*උපලේඛනය*

| `I තීරුව | | II තීරුව | | |
|---|---|---|---|---|
| *අනු අංකය* | *කර්මාන්තය* | *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750.00 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක* | *රු.1500.00 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු.* | *රු.* | *රු.* |
| 1. | ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | දර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | ලිපි ද්‍රව්‍ය, පොත් පත් නිපදවීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | පුවත්පත් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | රථ වාහන අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | ඇස් කණ්නාඩි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | ගීත පටිගත කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | ඇඳුම් මැසීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | බෑග් නිෂ්පාදනය කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | පාවහන් නිෂ්පාදනය කිරීමේ හා අලවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | පිංතූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ඡායා රූප ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | කෘෂි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | කොසු සහ ඉදල් නිෂ්පාදනය කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | එළවළු හා පළතුරු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | විසිතුරු පැළ හා මල් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | ලොතරැයි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | විසිතුරු භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | නාම පුවරු සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | උත්සව භාණ්ඩ කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | තේ පැළ තවන් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | තේ කොළ පැකට් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | කුළු බඩු පැකට් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | බෙලිමල් පැකට් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | විසිතුරු මත්ස්‍ය වගා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | ඡායා පිටපත් ලබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | බයිට් පැකට් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | රසකැවිලි පැකට් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | රට කජු පැකට් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | ගම්මිරිස් පැළ තවන් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

10-501/12

## බළන්ගොඩ ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා අන්තරාදායක හා අප්‍රසන්න වෙළඳ ව්‍යාපාර මත ගාස්තු පැනවීම

බළන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 05.01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්.සුනිල් ප්‍රේමසිරි,
සභාපති,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 20 වැනි දින,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව,
දිගදුර.

**යෝජනාව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශයට පත් කර ඇති පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 21 වැනි ඛණ්ඩයේ 1 වැනි ඡේදයේ විධි විධාන ප්‍රකාරව මෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන වෙළඳ ව්‍යාපාර අන්තරදයක හා අප්‍රසන්න වෙළෙඳ ව්‍යාපාර වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට බළන්ගොඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

***උපලේඛනය***

*අප්‍රසන්න ව්‍යාපාර :*

| *I තීරුව* | | *II තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු අංකය* | *බලය දෙනු ලබන කාර්යය* | *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750.00 නොඉක්මවන අවස්ථාවක* | *රු.750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක* | *රු.1,500.00 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු.ශත* | *රු.ශත* | *රු.ශත* |
| 1. | කෘත්‍රිම පොහොර හා කෘමි නාශක අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | මල් ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | ලුණු දෙහි නිපදවා අලෙවි කිරීමේ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | බයිට් නිපදවා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | රස කැවිලි නිපදවා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | පශු වෛද්‍ය සායන පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | පොල් කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | සත්ව ආහාර නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | සබන් හා රෙදි සෝදන කුඩු නිෂ්පාදනය හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | හඳුන්කූරු නිෂ්පාදනය කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ලෝහ සුන්බුන් තබා ගැනීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| *I තීරුව* | | *II තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු අංකය* | *බලය දෙනු ලබන කාර්යය* | *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750.00 නොඉක්මවන අවස්ථාවක* | *රු.750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක* | *රු.1,500.00 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු.ශත* | *රු.ශත* | *රු.ශත* |
| 12. | පලතුරු බීම හා අයිස් කැට නිපදවීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | පැණි, හකුරු නිපදවීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | සුවඳ විලවුන් නිපදවීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | පානීය ජලය බෝතල්ගත කර නිපදවීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | උම්බලකඩ පැකට් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | කරවල පැකට් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | කෑම පාර්සල් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

*අන්තරායදායක ව්‍යාපාර :*

| | | | | |
|---|---|---|---|---|
| 1. | ගඩොල් හා උළු නිපදවීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | මැටි භාණ්ඩ නිපදවීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | වාත්තු වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන නිපදවීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | බල්බ නිෂ්පාදනය කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | ඉලෙක්ට්‍රොනික් උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | නිවාස වයරින් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | කුෂන් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | වෑල්ඩින් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | හිස් ගෝනි, බෝතල්, අබලි ද්‍රව්‍ය, ටින් ලෝහ රැස් කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | මැණික් කැපීමේ හා ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ඡායා පිටපත් ලබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

*අප්‍රසන්න හා අන්තරායදායක ව්‍යාපාර :*

| *I තීරුව* | | *II තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු අංකය* | *බලය දෙනු ලබන කාර්යය* | *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750.00 නොඉක්මවන අවස්ථාවක* | *රු.750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක* | *රු.1,500.00 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු.ශත* | *රු.ශත* | *රු.ශත* |
| 1. | රථ වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | ඉන්ජෙක්ටර් පොම්ප අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | රේඩියේටර් අළුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | බැටරි චාර්ජ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | වී අඹරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | පිටි ඇඹරීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | පොල් තෙල් ඇඹරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | වඩු කර්මාන්තය සිදු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | කුළු බඩු ඇඹරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | සත්ව ගොවි පලවල් පවත්වාගෙන යාම (මස්, කිරි, බිත්තර) | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | රෙදි මුද්‍රණය, සායම් කිරීම්, බතික් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | තාර පෙර මුසු නිපැයුම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | කෙයොලින් මැටි, කැල්සයිට් ඩොලමයිට් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | කැල්සියම් කාබනේට් අවක්ෂේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | තිරුවානා ගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | කැල්සයිට් ඩොලමයිට්, පෙල්ස්පාර් ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | තිරුවානා, ඩොලමයිට් පිළිස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | කළුගල් ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | කළුගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | පාපැදි, යතුරු පැදි, ත්‍රීවිල් අළුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | මනාලියන් හැඩ ගැන්වීමේ හා රූපලාවන්‍ය කටයුතු සිදු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | කෘත්‍රිම දත් බඳින ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | බටහිර ඖෂධ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | ආයුර්වේද ඖෂධ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | ටයර් ටියුබ් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | එළවළු පලතුරු විජලනය කර ඇසුරුම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

10-501/13

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.